# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
14 වන මහල,සුහුරුපාය,බත්තරමුල්ල

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| දිනය Date | 2025.04.27 පැය 0600 | දුරකථන අංකය Tel.NO | 011-2887973 | මගේ අංකය My NO | D/Media/Out/ 850 /2025 | විද්‍යුත් ලිපිනය E-Mails | dir.media@police.gov.lk |


<u>පොලිස් මාධ්‍ය කොට්ඨාසය වෙත වාතර්ා වූ වැදගත් තොරතුරු</u>

**01. නිති විරෝධී මත්පැන් ප්‍රවාහනය කළ කාර් රථයක් පොලිස් භාරයට ගැනීම - මොරටුව පොලිස් ස්ථානය.**

වැඩ බලන පොලිස්පතිතුමාගේ උපදෙස් මත දිවයින පුරා ක්‍රියාත්මක වන පරිදි ශ්‍රීලංකා පොලිසිය සිදු කරගෙන යනු ලබන අපරාධ හා මත්ද්‍රව්‍ය නිවාරණ මෙහෙයුමට අදාලව 2025.04.26 වන දින උදෑසන කාලයේ මොරටුව පොලිස් වසමේ කටුබැද්ද මෝල පාර ප්‍රදේශයේදී මොරටුව පොලිස් ස්ථානයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **සැකකටයුතු කාර් රථයක් නවත්වා පරීක්ෂා කිරීමට සූදානම් වන අවස්ථාවේ එහි සිටි පුද්ගලයින් කාර් රථය දමා පලාගොස් ඇත. කාර් රථය පරීක්ෂා කිරීමේදී එහි තිබූ පොලිතින් උරවල දමා තිබූ නීති විරෝධී මත්පැන් ලිටර් 810 ක් සමඟ කාර් රථය** පොලිස් භාරයට ගෙන ඇත.

පලාගිය සැකකරුවන් අත්අඩංගුවට ගැනිම සඳහා මොරටුව පොලිසිය වැඩිදුර විමශර්න සිදු කරනු ලබයි.

**02. නීති විරෝධී ලෙස ගුවන් මගින් මෙරටට ගෙන්වන ලද සිගරට් තොගයක් සමඟ සැකකාරියක් අත්අඩංගුවට - පොලිස් මත්ද්‍රව්‍ය කායර්ංශය ගුවන්තොටුපල ඒකකය.**

2025.04.26 වන දින රාත්‍රී කාලයේ පොලිස් මත්ද්‍රව්‍ය කායර්ංශයේ ගුවන්තොටුපල ඒකකයේ නිලධාරීන්ට ලද තොරතුරක් මත **නීති විරෝධී ලෙස විදේශීය දුම්වැටි 6000 ක් (කාටුන් 30 ක්) සන්තකයේ තබාගෙන ගුවන් මඟින් අබුඩාබි සිට මෙරටට පැමිණි කාන්තාවක්** අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකාරිය වයස අවුරුදු 40 ක් වන වත්තල ප්‍රදේශයේ පදිංචිකාරියකි.**

පොලිස් මත්ද්‍රව්‍ය කායර්ංශය වැඩිදුර විමශර්න සිදු කරනු ලබයි.

**03. අයිස් මත්ද්‍රව්‍ය සහ හෙරොයින් සමඟ සැකකරුවෙකු හා සැකකාරියක් අත්අඩංගුවට - කොළඹ අපරාධ කොට්ඨාසය.**

2025.04.26 වන දින සවස් කාලයේ ග්‍රෑන්ඩ්පාස් පොලිස් වසමේ වදුල්ලවත්ත හා ස්ටේස් පාර ප්‍රදේශවලදී කොළඹ අපරාධ කොට්ඨාසයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීම් දෙකක් සිදු කර **අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 09 මිලිග්‍රෑම් 380 ක් සන්තකයේ තබා ගෙන සිටි සැකකරුවෙකු සහ හෙරොයින් ග්‍රෑම්**

**23 මිලිග්‍රෑම් 210 ක් සන්තකයේ තබා ගෙන සිටි සැකකාරියක්** අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 22 ක් වන ග්‍රෑන්ඩ්පාස් ප්‍රදේශයේ පදිංචිකරුවෙකු වන අතර සැකකාරිය වයස අවුරුදු 59 ක් වන වැල්ලම්පිටිය ප්‍රදේශයේ පදිංචිකාරියකි.**

කොළඹ අපරාධ කොට්ඨාසය වැඩිදුර විමශර්න සිදු කරනු ලබයි.

## 04. මෘත ශරීරයක් හමුවීම - පෑලියගොඩ පොලිස් වසම.

2025.04.26 වන දින උදෑසන කාලයේ පෑලියගොඩ පොලිස් වසමේ කලු පාලම ආසන්නයේ කැලණි ගඟේ පිරිමි මළ සිරුරක් ඇති බවට ලද පණිවිඩයක් මත පෑලියගොඩ පොලිසිය විමශර්න ආරම්භ කර ඇත.

**මරණකරුගේ අනන්‍යතාව මෙතෙක් තහවුරුවී නොමැත.**

මරණකරු වයස අවුරුදු 50 ක් පමණ වන උස, අඩි 05 අඟල් 06 ක් පමණ වන පුද්ගලයෙකි. කොණ්ඩය අඟලක් පමණ වවා ඇත. මෘත ශරීරය තරමක් විකෘති තත්වයට පත්ව ඇත. උඩුකයට නිල් පැහැති ටී ෂටර්යක් හැඳ සිටී යටිකය නිරුවත්ව ඇත.

මෘත ශරීරය කොළඹ ජාතික රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇති අතර පෑලියගොඩ පොලිසිය වැඩිදුර විමශර්න සිදු කරනු ලබයි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**